**ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 21 දින දෙපාර්තමේන්තුවේ නීති කෙටුම්පත් සම්පාදක වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.5 |
| | | 2. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.2.1 |
| 128(1)(ඡ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව<br>(වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.8 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන්

---

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීම
- නව නීති පැනවීමට සහ නීති සංශෝධනය කිරීමට භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සකස් කිරීම.
- ආණ්ඩුවේ නොයෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා දීම.
- නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.
- පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

### 2.2 කාර්යසාධනය

---

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2017 ප්‍රගති වාර්තාවේ සටහනට අනුව, 2017 දෙසැම්බර් 31 දිනට පනත් කෙටුම්පත් කිරීම ( මූලික හා සංශෝධන නීති ), උපකාරක නීති ප්‍රතිශෝධනය හා පළාත් සභා ප්‍රඥප්ති සකස් කිරීම සඳහා වූ මුළු ඉල්ලීම් පිළිවෙලින් 259, 341 හා 27 ක් වූ අතර එම දිනට තවදුරටත් නීති කෙටුම්පත් කිරීමේ කටයුතු අවසන් නොවී නීති කෙටුම්පත් සම්පාදක වෙත රැඳී තිබූ ඉල්ලීම් ප්‍රමාණය පිළිවෙලින් 10, 31 හා 01 ක් විය. කෙසේ වුවද තවදුරටත් මූලික කෙටුම්පත් කිරීමෙන් පසු නීතිපති හෝ අනෙකුත් දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් පිළිවෙලින් 156, 126 හා 08 ක් විය. මෙසේ නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් බාහිර පාර්ශවයන් රැඳී ඉල්ලීම් මුළු ඉල්ලීම්වල ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 60, සියයට 37 හා සියයට 30 ක් වූයෙන් තමාටම සීමා වූ වැඩසටහනක් නොමැති දෙපාර්තමේන්තුවක් වූ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි එම කරුණ ඍජුවම බලපා තිබූ බව නිරීක්ෂණය විය.

#### 2.2.1 කාර්යභාරයන් ඉටු නොකිරිම

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---

නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධන ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 185 ක් විය. මෙම ව්‍යාපෘතිය 2014 ජූලි 01 දින ආරම්භ කර ඇති අතර 2017 දෙසැම්බර් 31 දින නිමකළ යුතුව තිබුණි. එසේ වුවද එදිනට ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. 2014, 2015, 2016 හා 2017 වර්ෂ වලදී පිළිවෙලින් රු.659,934 ක්, රු.2,102,258 ක්, 1,939,829 ක් හා රු.4,008,902 ක් ලෙස එකතුව රු.8,710,923 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණු අතර උපයෝජනයේ ප්‍රතිශතය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.7 ක් විය.

### 2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ කොමිෂන් සභාවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 68.06 | 58.92 | 9.14 | 13 |
| | මූලධන | 50.55 | 6.09 | 44.46 | 88 |
| | **එකතුව** | **118.61** | **65.01** | **53.60** | **45** |
| 2014 | පුනරාවර්තන | 69.85 | 67.98 | 1.87 | 3 |
| | මූලධන | 42.48 | 7.86 | 34.62 | 81 |
| | **එකතුව** | **112.33** | **75.84** | **36.49** | **32** |
| 2015 | පුනරාවර්තන | 87.84 | 76.21 | 11.63 | 13 |
| | මූලධන | 70.81 | 11.92 | 58.89 | 83 |
| | **එකතුව** | **158.65** | **88.13** | **70.52** | **44** |
| 2016 | පුනරාවර්තන | 86.56 | 76.90 | 9.66 | 11 |
| | මූලධන | 31.30 | 15.86 | 15.44 | 49 |
| | **එකතුව** | **117.86** | **92.76** | **25.10** | **21** |
| 2017 | පුනරාවර්තන | 109.20 | 95.70 | 13.50 | 12 |
| | මූලධන | 30.20 | 28.74 | 1.46 | 5 |
| | **එකතුව** | **139.40** | **124.44** | **14.96** | **11** |

**2.4 බැදීම් හා බැරකම්**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 5 ප්‍රතිපාදනය රු.මිලියන 0.1 කින් ඉක්මවා රු.මිලියන 0.1 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ආ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |

## 2.6 විගණන හා කළමනාකරණ කමිටුව

2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(I)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්විය යුතු අතර දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට කාර්තුවකට එක බැගින් රැස්වීම් වාර 04 පැවැත්විය යුතු වුවත්, රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 83.18 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 42 | 29 | 13 | - |
| (ii) | තෘතියික මට්ටම | 28 | 14 | 14 | - |
| (iii) | ද්විතියික මට්ටම | 54 | 40 | 14 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 22 | 02 | - |
| (v) | කොන්ත්‍රාත් | - | 04 | - | 04 |
| | එකතුව | 148 | 109 | 43 | 04 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා, ආණ්ඩුවේ නොයෙකුත් ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ නීති කෙටුම්පත්කරණ කාර්යභාර්ය ඉටු කිරීම සඳහා ඍජුවම දායකත්වය ලබා දෙන කාර්ය මණ්ඩලයේ (ජ්‍යෙෂ්ඨ මට්ටම හා තෘතියික මට්ටම) 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 70 ක් වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 28 ක් වූයෙන් එය අනුමත මුළු සංඛ්‍යාවෙන් සියයට 40 ක ප්‍රතිශතයක් විය. මෙය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි ඍජුවම බලපෑම ඇති කරවන්නක් බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. විස්තර පහත දැක්වේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
| --- | --- |
| ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 07 |
| සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 05 |
| සහකාර අධ්‍යක්ෂ | 01 |
| පරිපාලන නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත බඳවාගත්) | 01 |
| ප්‍රධාන භාෂා පරිවර්තක | 01 |
| භාෂා පරිවර්තක | 13 |
| | 28 |

ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට උසස් වීම් ලබාදීම සඳහා ප්‍රමාණවත් සේවා කාලයක් (වසර 10) සම්පූර්ණ කර ඇති නිලධාරින් දෙපාර්තමේන්තුව තුළ නොවීම, භාෂා පරිවර්තක තනතුර සඳහා සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් නොමැති වීම නිසා එම තනතුරු පුරප්පාඩුව පවතින බවත්, සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා බඳවා ගැනීම් පරිපාටි සකස් කර අනුමත කිරීම සඳහා කටයුතු සිදු කර ඇති බවත් නිරීක්ෂණය විය.

**2.8 රජයේ නිලධාරීන් ඇප තැබීම**

ඇප තැබිය යුතු නිලධාරීන් හය (06) දෙනෙකු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.